**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**
பொலிஸ் ஊடகப் பிரிவு
**POLICE MEDIA DIVISION**
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.01.15 පැය 1540 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 67 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාතර්ා වූ වැදගත් තොරතුරු</u>

## 01. දිය අනතුරකින් විදේශීය ජාතිකයින් හයදෙනෙකු බේරා ගැනීම - පොලිස් ජීවිතාරක්ෂක ඒකකය හික්කඩුව

2025.01.14 වන දින සවස් කාලයේදී හික්කඩුව පොලිස් වසමේ නාරිගම වෙරළ තීරයේ දියනෑමට ගිය විදේශීය ජාතික කාන්තාවන් 04 දෙනෙකු හා පුද්ගලයින් 02 නෙකු දිය වැලකට හසුව ගසාගෙන යමින් සිටියදී එම ස්ථානයේ රාජකාරී යෙදී සිටි පොලිස් ජීවිතාරක්ෂක ඒකකයට අනුයුක්ත උප පොලිස් පරික්ෂක දේශප්‍රිය, පොලිස් කොස්තාපල් 94998 හේමකුමාර, පොලිස් කොස්තාපල් 27794 බණ්ඩාර, පොලිස් කොස්තාපල් 99492 කණිෂ්ක හා පොලිස් කොස්තාපල් 102748 දිසානායන යන නිලධාරින් විසින් ඔවුන් බේරාගෙන ඇත.

**අනතුරට පත් විදේශිකයින් අවුරුදු 25 ත් 32 ත් අතර වයස්වල පසුවන රුසියානු ජාතිකයින් වේ.**

## 02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - බස්නාහිර පළාත දකුණ අපරාධ කොට්ඨාසය.

2025.01.14 වන දින සවස් කාලයේ වැලිකඩ පොලිස් වසමේදී බස්නාහිර පළාත් දකුණ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් යතුරු පැදි හා නිවෙස් බිඳ දේපළ සොරකම් කිරීමේ අපරාධයන්ට සම්බන්ධ සැකකරුවෙකු පිළිබඳ ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර සැකකටයුතු යතුර පැදියක් නවතා පරික්ෂා කිරීමේදී ඔහු සන්තකයේ තිබී **අයිස් ග්‍රෑම් 10 මිලි ග්‍රෑම් 240 ක් හා ජංගම දුරකථනයක්** අත්අඩංගුවට ගෙන ඇත.

අත්අඩංගුවට ගත් සැකකරුගෙන් සිදු කළ ලද වැඩිදුර විමශර්නයේදී ඔහු විසින් පදවාගෙන ආ යතුරු පැදිය 2025.01.05 වන දින මුල්ලේරියාව පොලිස් වසමේදී සොරකම් කර ඇති බවත්, ඔහු සන්තකයේ තිබූ ඇපල් වගර්යේ දුරකථනය 2024.12.02 මාළඹේ පොලිස් වසමේ හෝකන්දර ප්‍රදේශයේ පිහිටි නිවසක් බිඳ සොරකම් කරන ලද දුරකථනයක් බවට තොරතුරු අනාවරණය වී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 40 ක් වූ හෝකන්දර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරු 2025.01.15 වන දින අළුත්කඩේ මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතය. බස්නාහිර පළාත් දකුණ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**